# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA


| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2022.10.21 |

## ජා.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 2022 සැප්තැම්බර් මාසයේ දී සියයට 73.7ක් වශයෙන් වාර්තා විය

ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි (ජා.පා.මි.ද., 2013=100)[1] වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2022 අගෝස්තු මාසයේ පැවති සියයට 70.2හි සිට 2022 සැප්තැම්බර් මාසයේ දී සියයට 73.7ක් දක්වා ඉහළ ගියේය. වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය මෙලෙස ඉහළ යෑම සඳහා ආහාර සහ ආහාර නොවන කාණ්ඩ දෙකෙහිම අයිතමවල මිල ගණන්හි සිදු වූ මාසික ඉහළ යෑම් හේතු විය. ඒ අනුව, ආහාර කාණ්ඩයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය 2022 අගෝස්තු මාසයේ පැවති සියයට 84.6හි සිට 2022 සැප්තැම්බර් මාසයේ දී සියයට 85.8 දක්වා ඉහළ ගිය අතර, ආහාර නොවන කාණ්ඩයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය 2022 අගෝස්තු මාසයේ පැවති සියයට 57.1හි සිට 2022 සැප්තැම්බර් මාසයේ දී සියයට 62.8 දක්වා ඉහළ ගියේය.

| උද්ධමනය | 2022 අගෝස්තු | 2022 සැප්තැම්බර් |
|---|---|---|
| **මතුපිට** | | |
| දර්ශක අගය | 250.4 | 256.2 |
| මාසික වෙනස (%) | 2.5 | 2.3 |
| වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය (%) | 70.2 | 73.7 |
| වාර්ෂික සාමාන්‍ය උද්ධමනය (%) | 31.3 | 36.9 |
| **මූලික** | | |
| දර්ශක අගය | 235.1 | 241.5 |
| මාසික වෙනස (%) | 2.7 | 2.7 |
| වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය (%) | 60.5 | 64.1 |
| වාර්ෂික සාමාන්‍ය උද්ධමනය (%) | 26.0 | 31.0 |

**ජා.පා.මි.ද. වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනයේ විචලනය (ප්‍රතිශත වෙනස)**




මෑතකාලීනව පෙන්නුම් කළ මාසික උද්ධමනයෙහි පහළ යෑම 2022 සැප්තැම්බර් මාසයේදී ද දක්නට ලැබුණි. ඒ අනුව, 2022 සැප්තැම්බර් මාසයේ දී ජා.පා.මි. දර්ශකයෙහි මාසික වෙනස සියයට 2.34ක් වූ අතර, ආහාර නොවන සහ ආහාර කාණ්ඩ දෙකෙහිම අයිතමවල මිල ගණන් පිළිවෙළින්, සියයට 1.96කින් සහ සියයට 0.38කින් ඉහළ යෑම මේ සඳහා හේතු විය. ආහාර නොවන කාණ්ඩය තුළ 2022 සැප්තැම්බර් මාසයේ දී, නිවාස, ජලය, විදුලිය, ගෑස් සහ වෙනත් ඉන්ධන (විදුලි ගාස්තු, භූමිතෙල් සහ ජල ගාස්තු) හා විවිධ භාණ්ඩ සහ සේවා යන උප කාණ්ඩයන්හි අයිතමවල මිල ගණන් ඉහළ ගියේය. මේ අතර, ආහාර කාණ්ඩය තුළ, පලතුරු, තිරිඟු පිටි සහ කුකුල් මස් මිල ගණන් ඉහළ යන ලදී. එසේ වුවද, සහල්, සීනි සහ පරිප්පු මිල ගණන් 2022 සැප්තැම්බර් මාසයේදී පහළ ගියේය.

**ජා.පා.මි.ද. මාසික ප්‍රතිශත වෙනස සඳහා දායකත්වය**




තවද, වාර්ෂික සාමාන්‍ය උද්ධමනය, 2022 අගෝස්තු මාසයේ පැවති සියයට 31.3හි සිට 2022 සැප්තැම්බර් මාසයේ දී සියයට 36.9 දක්වා ඉහළ ගියේය.

ආර්ථිකයේ යටිදැරි උද්ධමනය පිළිබිඹු කරන වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත මූලික උද්ධමනය, 2022 අගෝස්තු මාසයේ පැවති සියයට 60.5හි සිට 2022 සැප්තැම්බර් මාසයේ දී සියයට 64.1 දක්වා ඉහළ ගිය අතර, වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය, 2022 අගෝස්තු මාසයේ පැවති සියයට 26.0හි සිට 2022 සැප්තැම්බර් මාසයේ දී සියයට 31.0 දක්වා ඉහළ ගියේය.

[1] ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද., 2013=100), ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරනු ලබන අතර එමගින් ශ්‍රී ලංකාවේ සියලුම පළාත්වල කුටුම්බ විසින් මිලදී ගන්නා භාණ්ඩ හා සේවාවල මිලෙහි සාමාන්‍ය වෙනස්වීම් පෙන්නුම් කරනු ලබයි.

## උප කාණ්ඩ අනුව ජා.පා.මි.ද. මත පදනම් වූ මතුපිට උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස)




## ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි (2013=100) හැසිරීම

| කාලපරිච්ඡේදය | | දර්ශක අගය | | මාසික % වෙනස | | වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස | | වාර්ෂික සාමාන්‍ය % වෙනස | |
|---|---|---|---|---|---|---|---|---|---|
| වසර | මාසය | ජා..පා.මි.ද. | ජා..පා.මි.ද. (මූලික) | ජා..පා.මි.ද. | ජා..පා.මි.ද. (මූලික) | ජා..පා.මි.ද. | ජා..පා.මි.ද. (මූලික) | ජා..පා.මි.ද. | ජා..පා.මි.ද. (මූලික) |
| 2021 | සැප්තැම්බර් | 147.5 | 147.2 | 0.3 | 0.5 | 6.2 | 4.8 | 5.5 | 4.4 |
| | ඔක්තෝබර් | 150.6 | 150.6 | 2.1 | 2.3 | 8.3 | 7.2 | 5.7 | 4.6 |
| | නොවැම්බර් | 155.3 | 153.0 | 3.1 | 1.6 | 11.1 | 8.8 | 6.2 | 5.0 |
| | දෙසැම්බර් | 161.0 | 155.7 | 3.7 | 1.8 | 14.0 | 10.8 | 7.0 | 5.5 |
| 2022 | ජනවාරි | 166.0 | 159.2 | 3.1 | 2.2 | 16.8 | 12.9 | 8.1 | 6.2 |
| | පෙබරවාරි | 167.8 | 161.2 | 1.1 | 1.3 | 17.5 | 14.1 | 9.3 | 7.1 |
| | මාර්තු | 172.7 | 166.3 | 2.9 | 3.2 | 21.5 | 17.3 | 10.6 | 8.2 |
| | අප්‍රේල් | 190.3 | 182.3 | 10.2 | 9.6 | 33.8 | 27.9 | 13.0 | 10.2 |
| | මැයි | 208.7 | 197.9 | 9.7 | 8.6 | 45.3 | 37.7 | 16.3 | 13.0 |
| | ජූනි | 231.5 | 215.9 | 10.9 | 9.1 | 58.9 | 49.3 | 20.8 | 16.8 |
| | ජූලි | 244.4 | 229.0 | 5.6 | 6.1 | 66.7 | 57.3 | 25.9 | 21.3 |
| | අගෝස්තු | 250.4 | 235.1 | 2.5 | 2.7 | 70.2 | 60.5 | 31.3 | 26.0 |
| | සැප්තැම්බර් | 256.2 | 241.5 | 2.3 | 2.7 | 73.7 | 64.1 | 36.9 | 31.0 |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව